# ශ්‍රී ලංකා හිටපු මහකොමසාරිස්වරු වෙනුවෙන් විශේෂ ඒකකයක් නවදිල්ලියේ



ශ්‍රී ලංකාව නියෝජනය කළ හිටපු මහකොමසාරිස්වරුන් සිහිපත් කරන විශේෂ ඒකකයක් නවදිල්ලියේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ දී විවෘත කෙරිණි. දශක තුනකට වැඩි කාලයක් තිස්සේ මහ කොමසාරිස් කාර්යාලයේ සේවය කරන දීපක් නතානි, රේණු ෂර්මා සහ ප්‍රදීප් දස් යන ඉන්දීය නිලධාරීන් තිදෙනකු මෙම විශේෂ ඒකකය විවෘත කරන ලද අතර ඔවුහු හිටපු රාජ්‍ය තාන්ත්‍රිකයන් සමග සේවය කළ අත්දැකීම් සහිත වූවෝ වෙති. ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ, නියෝජ්‍ය මහ කොමසාරිස් නිලූක කදුරුගමුව ඇතුළු කාර්ය මණ්ඩලය එම අවස්ථාවට එක්ව සිටියහ.

1942 වසරේදී පළමු රාජ්‍ය තාන්ත්‍රිකයා වශයෙන් පත් වූ ශ්‍රීමත් බාරොන් ජයතිලකගේ සිට අවසානයේ දී රාජකාරී කළ ඔස්ටින් ප්‍රනාන්දු දක්වා වූ ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර සම්බන්ධතා සඳහා සුවිශේෂී මෙහෙවරක් කළ නිලධාරීන්ගේ ඡායාරූප විසි පහක් මෙහි ප්‍රදර්ශනය කර ඇත. දෙරට අතර නිල රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ආරම්භ කර මේ වනවිට වසර හැත්තෑ නවයකි.